**ශීර්ෂය 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය පිළිබඳව විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**
---------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය - 266 වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරන විගණන වාර්තාව 2016 ජූලි 27 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**
---------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**
-------

**2.1 විසර්ජන ගිණුම**
-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**
---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 263.25 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 262.07ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.18 හෙවත් සියයට 0.45 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 186.63 | 186.25 | 0.38 | 0.20 |
| මූලධන | 76.62 | 75.82 | 0.80 | 1.04 |
| **එකතුව** | **263.25** | **262.07** | **1.18** | **0.45** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 12 ක් විසින් එකතුව රු. මිලියන 505.50 ක් වූ ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 476.82 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 28.68 ක් හෙවත් සියයට 5.67 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට විෂය අංක 26601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.25 | 12.23 | 8.25 | 10.16 | 40.00 | 35.84 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අංක 7002/0000/00/0284/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31දිනට ශේෂය රු.මිලියන 29.55 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පොදු තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 111.89 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000 /00/0013/0083/ 000 | 73.97 |
| 6000/0000/00/ 0014/0014/000 | 9.58 |
| 6000/0000/00/0016/0072/ 000 | 28.34 |
| **එකතුව** | **111.89** |

## 2.5 විගණන නිරීක්ෂණය

-----------------------

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමණාකරන විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii) | හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (iii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විසර්ජන ගිණුම

----------------

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන**

-------------------------------------------------------------------

විවිධ කාර්යන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණනය පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව**

-------------------------------------

2015 වාර්ෂික අය වැය ඇස්තමේන්තුව මගින් අතිගරු ජනාධිපතිතුමා විසින් නියඟයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ කුඩා ගොවීන්ට සහන සැලසීමේ අරමුණින් ක්‍රියාත්මක කළ වැඩසටහන යටතේ වවුනියාව දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රතිපාදන සලසා තිබුණි. එම වැඩසටහන යටතේ ගොවීන් 16,533 දෙනෙකු වෙත රු.මිලියන 139.25 ක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 නොවැම්බර් 07 දිනැති අංක 7/5/8/4/-254 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 04 ඡේදයට ප්‍රකාරව ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී කුඹුරුනාම ලේඛන හෝ පොහොර සහනාධාර ලේඛන හෝ අක්කර බදු ලේඛන මගින් ඉඩම්වල විස්තර තහවුරු කරගත යුතුව තිබුණි. එකී ලේඛන මගින්

තහවුරු කර ගැනිමට නොහැකි වූ විට කමිටුවක් පත් කර ඒ මගින් ඉඩම්වල ප්‍රමාණය තීරණය කළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණි. එම ලේඛන සංශෝධනය වී නොමැති බැවින් කමිටුව විසින් තීරණය කරනු ලැබූ ප්‍රතිලාභීන්ට ගෙවීම් කර තිබුණත් කමිටු පත්කළ බවට සහ එකී කමිටු මගින් තීරණ ගත් බව සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) වවුනියාව දිස්ත්‍රික්කයේ 2014 යල කන්නයේ වගා කළ ඉඩම් අක්කර 4,387 ක් පොහොර සහනාධාර ක්‍රමය යටතේ රක්ෂණය කර තිබුණි. එම ඉඩම් නියඟය මත හානි වූයේ නම් රක්ෂණ භාරකාර අරමුදල මගින් වන්දි ලබා ගැනීමට හිමිකම් තිබුණි. ඒ අනුව ගොවීන් වෙනුවෙන් අක්කරයකට රු.2,800 බැගින් එකතුව රු.12,283,600 ක් ගෙවා තිබුණි.

(iii) ගොවීන් වැඩි පිරිසක් මහ කන්නයේදී කුඹුරු ඉඩම් වගා කර යල කන්නය පුරන් වීමට ඉඩ හැරීම සාමාන්‍ය ක්‍රමවේදය විය. ඒ අනුව පොහොර සහනාධාර ලබාදීමේ ලේඛනයට අනුව 2014 යල කන්නයේ අක්කර 4,387 ක ප්‍රමාණයක් වගා කර තිබූ අතර එකී අක්කර ප්‍රමාණය ඉක්මවා අක්කර 45,346 කට රු.මිලියන 126.97 ක් ගෙවා තිබුණි.

(iv) 2014 නොවැම්බර් 07 දිනැති අංක DFD/SP/2014 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුව ආධාර ගෙවීමේදී ආධාරලාභී එක් එක් ගොවියා විසින් එකී කුඹුරු ඉඩම 2014/15 මහ කන්නයේ වගාකළ බව තහවුරු කර ගත යුතු වුවත්, එසේ කර නොතිබුණි.

(v) මූල්‍ය ආධාර ගෙවීම් කරනු ලැබූ කුඹුරු අක්කර ප්‍රමාණය සහ 2014/2015 කන්නයේ වගා කළ ඉඩම් ප්‍රමාණය හා සැසදීමේදී ඉඩම් අක්කර 9,441 ක ප්‍රමාණයක් වගාකර නොතිබුණි. ප්‍රදේශයේ ලියාපදිංචි නොවූ හෝ හඳුනා ගැනිමට නොහැකි වූ කුඹුරු ඉඩම් සඳහා ගෙවීම් කර තිබුණු බව එමගින් සනාථ වී තිබුණි. ඒ අනුව කුඹුරු ඉඩම් අක්කර 9,441 ක් වෙනුවෙන් රු.මිලියන 26.43 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද මෙම මුදල නැවත අයකර ගැනීමට පියවර ගන්නා බව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් විසින් එවා තිබුණු පිළිතුරේ සඳහන් කර තිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.

විෂය අංක 26601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.280,904 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂ 03 කට පෙර මැණික් ෆාම්වලින් ලැබුනු රෝද හතරක ට්‍රැක්ටර් රථ දෙකෙහි විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එකී වාහන භාවිතයෙන් ඉවත් කිරීමට හෝ භාවිතා කිරීමට හෝ වෙනත් ආයතනයකට හෝ අංශයකට පැවරීම හෝ කිසිදු වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ආ) යාපනය දිස්ත්‍රික් ලේකම් සතුව තිබූ තාක්ෂණික වශයෙන් යල්පැනගිය සහ විශාල වියදමක් කර අළුත්වැඩියා කිරීමකින් පසු භාවිතා කළ හැකි NEHRP ව්‍යාපෘතියේ නිලධාරීන් භාවිතා කළ යතුරු පැදි 06 ක් අවශ්‍යතාවය හඳුනා නොගෙන 2012 ජුලි 31 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරා ගෙන තිබුණි. යතුරුපැදිවලින් එක් යතුරු පැදියක් අළුත්වැඩියා කිරීම සඳහා රු.38,620 ක් වැය කර, යතුරු පැදි ලබා ගැනීමේ හිමිකමක් නොමැති නිලධාරියෙකුට ලබාදී තිබුණි. ඉතිරි යතුරුපැදි 2015 නොවැම්බර් 30 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

### 3.5 කාර්යසාධනය

---------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2013/2014 වර්ෂයේ ඉදිකරනු ලැබූ මහල් ගොඩනැගිල්ලේ බිම් මහල 2015 වර්ෂයේ සිට මසකට රු.10,000 ක් බැගින් වූ කුලී මුදලකට ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණි. එම ආදායම රාජ්‍ය ආදායමට බැර නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුභසාධක සමිතියට ගෙවා තිබුණි.

(ආ) වවුනියාව දිස්ත්‍රික් ලේකම් සතු රජයේ නිවාස සඳහා ඉල්ලුම් කර තිබුණු රජයේ නිලධාරීන්ගේ පොරොත්තු ලේඛනය අනුව විවිධ ශ්‍රේණිවල රජයේ නිවාස සඳහා 2008 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රජයේ නිවාස නොලැබුණු නිලධාරීන් සංඛ්‍යාව 74 ක් වී තිබුණි. නිලධාරීන්ගේ සේවා අවශ්‍යතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමකට ගෙන ඒමට ඔවුන්ගේ සේවා පහසුකම් වෙනුවෙන් ඉදි කර තිබුණු රජයේ නිවාස වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිවාස 06 ක් විවිධ රජයේ ආයතන, දේශපාලන අධිකාරියට අයත් කාර්යාලවලට සහ පුද්ගලයින්ට ලබා දී තිබුණි. මේ නිසා නිලධාරීන්ට රජයේ නිවාස පහසුකම් ලබා දීම සීමා වී තිබූ අතර එකී නිවාසවලින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු කුලී ආදායමක් ලබා ගෙන නොතිබුණි.

(ඇ) වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළමු මහලේ දෙවන අදියර ඉදිකිරීම් සඳහා රු.5,065,982 ක් සමාලෝචිත වර්ෂයේ වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ඉංජිනේරු ඇස්තමේන්තුවට අනුව වැඩ විෂය අංක 4.18 යටතේ ජිප්සම් මෝල්ඩින් (Gypsum Molding ) සිවිලිම සහ LED විදුලි ලාම්පු පෙන්වා දී ඇති ස්ථානවල සවිකිරීම සඳහා රු.1,650,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. වැඩ නිමවීමෙන් පසු ඉදිකිරීම් භාරගත් කොන්ත්‍රාත්කරුට රු.1,596,802 ක් ගෙවා තිබුණි. මෙම වැඩ විෂය වෙනුවෙන් විශ්ලේෂණාත්මක වියදම් විස්තර සහ සැලසුම් සකස් කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු විසින්ම ඉටු කර තිබුණු ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. එම ඉදිකිරීම ඉංජිනේරු/තාක්ෂණික නිලධාරිගේ අධීක්ෂණයෙන් බැහැරව සිදු කර තිබුණු අවිධිමත් ගනුදෙනුවක් වශයෙන් නිරීක්ෂණය විය.

(ii) කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉල්ලීම පිළිනොගෙන දින 18 කින් කාලය දීර්ඝ කර තිබුණි. මේ නිසා රජයට රු.22,180 ක පාඩුවක් සිදු වී තිබුණි.

(iii) ඉංජිනේරු ඇස්තමේන්තුවේ වැඩ අංක 2.3, 2.4 සහ 2.5 ට අදාළ වැඩ කොටස් (තීන්ත ආලේප කිරීම) වැඩ අංක 4.13, 4.14 සහ 4.15 හි ඇතුළත්වීම මත ද්විගණනයක් සිදුවී තිබුණි. මේ නිසා එකී වැඩ විෂයන්ට අනුව ඒකකයක වටිනාකම

හා ප්‍රමාණය සැලකීමේදී වටිනාකම් අඩුවෙන් දැක්වීම මත මුළු ඇස්තමේන්තු වටිනාකම රු.78,396 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) අනුමත ඇස්තමේන්තුවට අනුව ගෙවීම් බිල් පත්‍ර සැසඳීමේදී වැඩ විෂයයන් 52 ක එකතුව රු.2,050,803 ක් ඇස්තමේන්තුවේ ඇතුළත් වී නොතිබුණි. එමෙන්ම වැඩ විෂයන් 16 ක එකතු වටිනාකම රු.314,990 ක් වූ වැඩ කොටස් ඇස්තමේන්තුවේ වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු විධිමත් පරිදි සකසා නොතිබුණි.

(v) ගිවිසුම්ගත කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.780,000 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර 06 ක් සපයා සවිකිරීමට ඇස්තමේන්තු කර තිබූ නමුත් අනුමත ප්‍රතිපාදනය තුළ එකී කාර්යය ඉටු කර නොතිබුණි.

## 3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------

2014 වර්ෂයේ වවුනියාව දකුණු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් යෙෂිකා වර්ගයේ ඩිජිටල් කැමරාවක්, කැරම් බෝඩ් එකක් , කැසට් යන්ත්‍රයක් හා කැසට් පීස් 10 ක් ඌනතා වාර්තා කර තිබුණි. නමුත් 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එම භාණ්ඩ වර්ග හතර විනාශ කළ යුතු භාණ්ඩ ලෙස නම් කර තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි.

## 3.7 පාඩු හා හානි

--------------

වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළමු මහලේ දෙවන අදියර ඉදිකිරීම සඳහා රු.5,065,982 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. එකී ඉදිකිරීම සිදු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2(ආ) මාර්ගෝපදේශයට පටහැනිව තොරාගත් ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.4,648,543 ක ලංසු වටිනාකම රු.4,929,043 ක් ලෙස සංශෝධනය කර තිබුණි. මේ නිසා රජයට 280,500 ක පාඩුවක් සිදු වි තිබුණි.

## 3.8 අනාර්ථික ගනුදෙනු

--------------------

2012 වර්ෂයේ NECODE ව්‍යාපෘතිය සතු කැබ් රථයක් දිස්ත්‍රික් සැලසුම් ඒකකයට 2012 වර්ෂයේ භාර දී තිබුණි. එකී කැබ් රථය විගණිත දින වූ 2015 නොවැම්බර් 30 දින වන විටත් පාවිච්චි කර නොතිබූ අතර එකී කාලය තුළ එනම් 2014 දෙසැම්බර් මාසයේදී රු.189,050 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

------------------------

නියැදි විගණන පරික්ෂණවලදී පහත සඳහන් දුර්වලතා අනාවරණය විය.

(අ) 2011 නොවැම්බර් 29 දිනැති අංක MED/TR/05/9675 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය අනුව වවුනියාවේ දේශපාලන පක්ෂයක සංවිධායකවරුයෙකුට බාර දී තිබූ ඩබල් කැබ් රථයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය විසින් නැවත බාරගෙන තිබුණි. එකී ලිපියේ අවසන් ඡේදයට අනුව වාහන පාවිච්චි කළ පාර්ශවයෙන් බාර ගැනීමේ දී දිස්ත්‍රික් මෝටර් රථ පරීක්ෂකවරයාගේ පරීක්ෂාවට ලක් කිරීමෙන් පසු බාර ගත යුතු බව දන්වා තිබුණි. නමුත් එසේ කර නොතිබුණු අතර විගණිත දිනය වූ 2015 නොවැම්බර් 30 දින වන විටත් එම වාහනය සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. වර්ෂ 04 ක කාලයක්

එම රථය ගරාජයේ ගාල් කර තිබුණි. තවද එකී ලිපියේ සඳහන් උපදෙස් ක්‍රියාත්මක නොවීම මත වාහන පාවිච්චි කළ පුද්ගලයා වෙතින් වාහනයට හානියක් සිදුවී ඇත්නම් එකී හානිය ඔහුගෙන් අයකර ගැනීමට තිබූ අවස්ථාද එමගින් අහිමි වී තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ වර්ෂ ගණනාවක සිට රියදුරු හිඟයක් තිබියදී සැලැසුම් අංශයට අනුයුක්ත කළ රියදුරෙකුට 2014 මාර්තු මාසයේ සිට 2015 නොවැම්බර් මාසය දක්වා වූ කාලය තුළ සැලසුම් අංශය සතු වාහනයකට හෝ වෙනත් අංශයක වාහනයකට හෝ වෙනත් දෙපාර්තමේන්තුවකට හෝ අංශයකට හෝ මාරු නොකර නිෂ්කාර්යව තබා වැටුප් වශයෙන් එකී කාලය පරිච්ඡේදයේදී රු.611,804 ක් ගෙවා තිබුණි

(ඇ) වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළමු මහල ඉදිකිරීම, සංචාරක බංගලාව ඉදිකිරීම හා දිස්ත්‍රික් ලේකම්වරයා පදංචි රජයේ නිවසේ භෝජනාගාරය ඉදිකිරීමට 2014 වර්ෂයේ රු.12,986,800 ක් ද, 2015 වර්ෂයේ රු.30,241,760 කද, ගෙවා තිබුණි. නමුත් එකී ඉදිකිරීම් සැලැසුම් කිරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 20 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 15 | 06 | 09 | - |
| (iii) | ද්විතියික මට්ටම | 349 | 237 | 112 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 66 | 51 | 15 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්) | - | 04 | - | 04 |
| | **එකතුව** | **450** | **318** | **136** | **04** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.